**ශීර්ෂය 269 - මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**

----------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව මොනරාගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/209 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මඩකලපුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/209 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායීත්වය

පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් තොර බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ආර්ථික තීරණ ගැනීමේදී ඒ පිළිබඳව සැලැකිලිමත් විය යුතුය.

වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීමෙන් වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී, මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව,

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපී වන බවත්

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මවිසින් ඉදිරිපත් කළ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඡේදයට යොමුව | විගණන නිරීක්ෂණ | නිර්දේශ |
|---|---|---|
| 1.6.2(ඉ) | සමාලෝචිත වර්ෂයේ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විකුණුම්වලින් ලැබූ රු.103,100ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූලධන ක්‍රියාකාරකම්වලින් වූ ගලාඒම් ලෙස නොදක්වා මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වූ මුදල් ගලා ඒම් ලෙස දක්වා තිබුණි. | විකුණුම් මගින් ලැබූ මුදල් ගලා ඒම් මූලධන ක්‍රියාකාරකම්වලින් වූ ලැබීම් ලෙස මුදල් ප්‍රවාහ යටතේ හෙළිදරව් කළ යුතුවේ. |
| **3.3(අ)** | සුනාමියෙන් පීඩාවට පත් අය නැවත පදිංචි කිරීම සඳහා ඉඩම් අත්පත් කර එම ඉඩම්වලට වන්දි ගෙවීමේ කටයුතු මන්මුනේ උතුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් 2017 වර්ෂයේදී සම්පූර්ණ කර තිබුණි. ඉන් පසුව පුද්ගලයන් තිදෙනෙකු විසින් ව්‍යාජ ලියකියවිලි ඉදිරිපත් කර රු.මිලියන 6.3 ක් වන්දි ලබාගෙන තිබුණි. එසේ වුවත්, අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වගකිව යුතු නිලධාරීන් විසින් අදාල ලේඛනවල නිවැරදිභාවය පිළිබඳව අවධානය යොමු නොකර මෙම වන්දි මුදල් ගෙවීමට නිර්දේශ කර තිබුණි. එසේම එම නිලධාරීන්ට එරෙහිව කිසිදු ආකාරයක විනය පරීක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | නිලධාරීන් නොසැලකිල්ලෙන් කටයුතු කළ බැවිනුත්, රාජකාරීය වගකීමකින් තොරව ඉටුකිරීම නිසාත් රජයට පාඩු සිදුකළ බැවිනුත්, මුදල් රෙගුලාසි ප්‍රකාරව නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන වාර්තාව**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මුදල් රෙගුලාසි 106 සහ 113 ප්‍රකාරව, කාර්යාල වාහන 26කට සිදුවූ අනතුරු 32ක් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් වාර්තාවේ මුළු පාඩුව ලෙස රු.7,574,260ක් දක්වා තිබුණි. කෙසේවෙතත්, මෙම පාඩුවට රක්ෂණ ආයතනයෙන් ලැබූ වන්දි රු.6,730,186ක්, පාඩුවට එරෙහිව ගැලපීම් සිදු කර නිවැරදි අලාභය ගිණුම්වල දක්වා නොතිබුණි. | මුදල් රෙගුලාසි106 සහ 113 ප්‍රකාරව, පාඩු සම්බන්ධයෙන් රක්ෂණ ආයතනයෙන් ලැබූ මුදල ගැලපීම් කර නිවැරදි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුවේ. | වාහන අනතුරු සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් පිළිබඳ වාර්තාවේ, පාඩු වටිනාකමෙන් රක්ෂණ ආයතනයෙන් ලැබූ වන්දි මුදල් මෙන්ම වගකිව නිලධාරීන්ගෙන් ලැබූ මුදල්ද වියීමත් කපාහැරීම් සිදුවන අවස්ථාවේදී අදාල පාඩුවේ වටිනාකම ගලපනු ලැබේ. |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | ගොඩනැගිලි ඉදිකිරීම්වල ආරම්භක ශේෂය රු.1,148,016,532 මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.1,180,780,385ක් ලෙස දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයේ මුළු වත්කම් රු.32,73,853කින් වැඩියෙන් දක්වා තිබුණි. | ජංගම නොවන වත්කම්වල තථ්‍ය වටිනාකම් සමාලෝචිත වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුවේ. | අදාල කාරණාව නිවැරදි කිරීමට භාණ්ඩාගාරයට දැනුම්දී භාණ්ඩාගාරය විසින් ගැලපීම් කටයුතු සිදු කරනු ලැබේ. |
| (ii) | යන්ත්‍ර හා උපකරණවල ආරම්භක ශේෂය රු.405,147,500, මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ රු.403,156,986ක් ලෙස දැක්වීම නිසා සමාලෝචිත වර්ෂයට අදාල ජංගම නොවන වත්කම් රු.1,990,514කින් අඩුවෙන් දක්වා තිබුණි. | ජංගම නොවන වත්කම්වල තථ්‍ය වටිනාකම් සමාලෝචිත වර්ෂ මූල්‍ය ප්‍රකාශනවල නිවැරදිව දැක්විය යුතුවේ. | වර්තමානයේ Web Interface මගින් නිවැරදි කර ඇත. |
| (iii) | වැඩ අවසන් නොවූ නව දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගොඩනැගිල්ල සහ මන්මුනෙයි දකුණ එරුවිලපත්තු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැගිලි ඉදිකිරීම් කාර්යයන් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ගෙවූ එකතුව රු.477,697,552 මූල්‍ය ප්‍රකාශනවල ගොඩනැගිලි හා ඉදිකිරීම් ගිණුම යටතේ දක්වා තිබුණි. | වැඩ අවසන් නොවූ ගොඩනැගිලි සඳහා ගෙවූ මුදල් මූල්‍ය ප්‍රකාශනවල නොනිමි වැඩ ලෙස හෙළිදරව් කළ යුතුවේ. | අදාල ගිණුම් තැබීමේ ක්‍රියාවලිය CIGAS ගිණුම් පැකේජ මාර්ගයෙන් සිදු කර තිබූ බැවින් අදාල ගිණුම් මාරු කිරීම සම්බන්ධයෙන් සුදුසු ක්‍රමවේදයක් අනුගමනය කර ඉදිරියේදි සුදුසු ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (iv) | සමාලෝචිත වර්ෂයේ කාර්යාල වාහනයට සිදුවූ අනතුරෙහි පාඩුව සම්බන්ධව නිවැරදි වටිනකම රු.1,460,348ක් මූල්‍ය ප්‍රකාශනවල පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ හෙළිරව් කර නොතිබුණි. | කාර්යාල වාහනයට සිදු වූ නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශනයේ පාඩු හා අත්හැරීම් ප්‍රකාශයේ හෙළිදරව් කළ යුතුවේ. | රාජ්‍ය පරිපාලන, අභ්‍යන්තර කටයුතු, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයේ ගැලපීම් සම්බන්ධයෙන් අනුමැතිය ලැබී ඇත. වටිනාකම තක්සේරු කර ඉදිරි 2020 වර්ෂය සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශනවලට එකතු කරනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (v) | ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රජයේ නිවාසවල තක්සේරු වටිනාකම ඇගයීම් කර මූල්‍ය ප්‍රකාශනවලට අදාල වටිනාකම් දක්වා නොතිබුණි.කාර්යාල 06ක ලේකම් | ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ රජයේ නිවාසවල තක්සේරු වටිනාකම ඇගයීම් කර මූල්‍ය ප්‍රකාශනවල දැක්වා යුතුවේ. | ඉහත සඳහන් අමාත්‍යාංශය විසින් මේ දක්වා ඇගයීම් කර ලබා නොදීම නිසා මේවාහි වටිනාකම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. |

**1.6.3 මූලධන වියදම්**

---------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව, සමාලෝචිත වර්ෂයේ භාණ්ඩාගාරය විසින් අනුමත කළ එකතුව රු.6,417,718ක් මූල්‍ය ප්‍රකාශනවල මූලධන වියදම් සාරාංශයේ රු.6,500,238ක් ලෙස දක්වා තිබුණි. | වැඩසටහන් දෙකක් අතර මාරුකිරීමේදී ශීර්ෂය 269-1-2-0-149 යටතේ ප්‍රතිපාදන මාරුකළ රු.82,479.00 දෙවරක් වැරදීමකින් දැක්වීම නිසා එම වටිනාකම රු.6,500,238ක් ලෙස දක්වා තිබුණි. | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව, භාණ්ඩාගාරය විසින් අනුමත කළ වටිනාකම මූල්‍ය ප්‍රකානවල මූලධන වියදම් සාරාංශයේ දැක්වාය යුතුවේ. |

**1.6.4 භාණ්ඩාගාර පොත් සමග නොසැසදීම**

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරුණු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | භාණ්ඩාගාර මුද්‍රිත පිටපතේ, බැරකම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම් සාරාංශයේ 9165-0-0-269-0-0-0 විෂයය යටතේ දක්වා තිබූ රු.2,170,063,633ක් මූල්‍ය ප්‍රකශෙනවල දක්වා නොතිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපතේ, බැරකම් සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම් සාරාංශයේ දක්වා ඇති වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතුවේ. | Cigas මාර්ගයෙන් ගිණුම් සාරාංශ ක්‍රියාවලියේදී ජංගම නොවන වත්කම් ගිණුම් තැබීම වේ. එසේම, Cigas Web Interface මාර්ගයෙන් ලබාදීම නිසා නියමිත ශීර්ෂයන්වලට කිසිදු සංශෝනධයක් සිදු කළ නොහැකිය. |
| (ii) | භාණ්ඩාගාර මුද්‍රිත පිටපත් ප්‍රකාරව, බැරකම් නොමැති වුවත් මූල්‍ය ප්‍රකශෙනවල බැරකම් පිළිබඳ සාරාංශයේ (සටහන (IV)) රු.671,382ක් බැරකම් ලෙස දක්වා තිබුණි. | භාණ්ඩාගාර මුද්‍රිත පිටපතේ දක්වා ඇති අගයම මූල්‍ය ප්‍රකාශනවලත් හෙළිදරව් කළ යුතුවේ. එලෙස නොදැක්වුයේ නම් විචලනයන් සඳහා පැහැදිලි කිරීම් සහිතව මූල්‍ය ප්‍රකශෙනවල මෙම කරුණ සඳහන් කළ යුතුවේ. | මූල්‍ය ප්‍රකාශනවල බැරකම් පිළිබඳ ප්‍රකාශයේ (සටහන් (IV)) දක්වා ඇති වටිනාකම අදාල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නියමිත වැය විෂයයන්වල ප්‍රතිපාදන අවසන් වීම නිසාත්, ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම නිසාත් බැරකම් ලෙස දැක්වූ ඒවා විය. |

**1.6.5 මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂ මුදල් ප්‍රවාහයේ සිදුවූ ශුද්ධ ප්‍රවාහය ශුන්‍ය අගයක්ව පැවතුණද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ශුද්ධ මුදල් ප්‍රවාහය ලෙස රු.58,417,194ක සෘණ අගයක් විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයේ දෙමළ පිටපතෙහි සඳහන්ව තිබුණි. | විගණනයට ඉදිරිපත් කළ මූල්‍ය ප්‍රකාශනයේ දෙමළ, සිංහල සහ ඉංග්‍රීසි පිටපත්වල සඳහන් සියළුම වටිනාකම් එකිනෙකට පටහැනි නොවී තිබිය යුතුවේ. | ශුන්‍ය වටිනාකම් ලෙස දෙමළ මුල් පිටපතෙහි පිටපත් කිරීමේදී හා ඇමුණුම් කටයුතුවලදී සිදුවූ නොසැලකිල්ල හේතුවෙන් මෙලෙස සිදුවී තිබුණි. |

**1.6.6 විගණනය සඳහා සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට සමාලෝචිත වර්ෂයේ ඉදිරිපත් කළ විගණන විමසුම් 2ක් සඳහා 2020 අගෝස්තු 12 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි.එසේම විගණන විමසුම්වලට අදාල ඇස්තමේන්තුගත ගනුදෙනුවල එකතුව රු.11,612,500ක් වේ. | ජාතික විගණන කාර්යාලය විසින් නිකුත් කරන විගණන විමසුම් සඳහා පිළිතුරු කඩිනමින් ලබාදිමට කටයුතු කළ යුතු වීම. | විගණන විමසුම් සඳහා පිළිතුරු කඩිනමින් නිකුත් කිරීමට කටයුතු කරමින් පවති. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 අග්‍රිම කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සැලසුම් කළ ආකාරයෙන් අදාල කාල පරාසය තුළ නියමිත කාර්යයන් ඉටු නොකර, එම කාර්යයන් වර්ෂය අවසානයේ ක්‍රියාත්මක කිරීමට පෙළඹීමෙන් අවශ්‍ය අග්‍රිම භාණ්ඩාගාරයෙන් ලබා දී නොතිබුණි. මේ නිසා එකතුව රු.424,676,441 ක් වටිනා කාර්යයන් 496 ක් නිමකළ නොහැකි වී තිබු බව නිරීක්ෂනය විය. | සැලසුම් කළ ආකාරයෙන් අග්‍රිම ලබා ගනිමින් නියමිත කාලසීමාව තුළ නිම කිරීමට සුදුසු කටයුතු කළ යුතුය. | වර්ෂයේ හතරවැනි කාර්තුවේ සංවර්ධන කාර්යයන් සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන ලැබෙන නිසා දිස්ත්‍රික්කයේ සංවර්ධනය සලකා අදාල කාර්යයන් වර්ෂ අවසානයේදී ක්‍රියාත්මක කිරීමට සිදුවීම නිසා අදාල කාර්යයන් වෙනුවෙන් අග්‍රිම ලබාගැනීමට නොහැකි විය. |

**2.2** **ආදායම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ අනෙකුත් ලැබීම් සඳහා ආදායම් ඇස්තමේන්තුව රු.30,646,200ක් වූවත්, තථ්‍ය වශයෙන් රැස්කළ ආදායම රු.258,244,484ක් වූ බැවින් ආදායම් ඇස්තමේන්තු ප්‍රායෝගික නොවන අයුරින් පිළියෙල කර තිබූ බව අනාවරණය විය. | මුදල් රෙගුලාසිවල විධිවිධානවලට අනුව ආදායම් ඇස්තමේන්තු ප්‍රායෝගික වන අයුරින් පිළියෙල කළ යුතුවේ. | ආදායම් අයකිරීම් පිළිබඳව අදාල දෙපාර්තමේන්තු විසින් ඇස්තමේන්තු නොකැඳවීමෙන් ඒ සම්බන්ධයෙන් අප විසින් ඇස්තමේන්තු කිරීමක් සිදු නොකෙරේ. මේ හේතුවෙන් ඇස්තමේන්තුවට වඩා වැඩියෙන් ආදායම් රැස්කර තිබුණි. |

**2.3** **වියදම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| මුදල් අමාත්‍යාංශයේ 2019 ජුනි 17 දිනැති අංක 04/2019 දරන අයවැය චක්‍රලේඛයේ 02(II) වගන්තිය ප්‍රකාරව, විදුලිය වියදමින් සියයට 5ක ඉතිරි කිරීම සඳහා අවධානය යොමු කරන ලෙස නියෝග කර තිබුණත්, මෙම උපදෙසට පටහැනිව සලසා තිබූ ප්‍රතිපාදනවලින් සියයට 1කටත් වඩා අඩු ප්‍රමාණයක් ඉතිරි කර තිබුණි. | මුදල් අමාත්‍යාංශයේ චක්‍රලේඛය ප්‍රකාරව, විදුලිය වියදමින් සියයට 5ක් ඉතිරි කිරීම සඳහා කටයුතු කළ යුතුය. | ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භාවිතය සඳහා නව ගොඩනගිලි සංකීර්ණ ඉදිකර එහි භාවිතය නිසාත්, රජය විසින් ලබාදුන් උපාධිධාරී අභ්‍යාසලාභි නව පත්වීම් නිසාත් විදුලිය භාවිතයේ වැඩිවීමක් සිදුවිය. |

**2.4** **ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු තහවුරු කිරීම**

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධානවලට අනුව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහ ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් තහවුරු කළ යුතු වුවද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය පහසු කිරීම සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කොට ක්‍රියාත්මක කරගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී විසින් තහවුරු කළ යුතු වුවත්, එම පද්ධතියේ ඵලදායීතාවය සම්බන්ධයෙන් කාලයෙන් කාලයට එම පද්ධතිය සමාලෝචනයන් සිදු කොට ඒ අනුව පද්ධතියක් ඵලදායීව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනස්කම් සිදුකළ යුතුය. එසේ වුවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කොට එහි පිටපතක් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවත්, එවැනි සමාලෝචනයක් සිදුකොට ප්‍රකාශනයක් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**2.5** තැන්පතු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- |
| නැගෙනහිර පළාත් ග්‍රාමීය කර්මාන්ත දෙපාර්තමේන්තුවෙන් ඉඩම් අත්පත්කිරීම සහ අපජලය බැහැර කිරීම ව්‍යාපෘතිය සඳහා 2016 සහ 2017 වර්ෂවල ලැබූ රු.450,000ක් නියමිත කාලය තුළ උපයෝජනය නොකර වර්ෂ 02කට අධික කාලයක් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකර තැන්පත් ගිණුමේ අඛණ්ඩව රඳවා තිබුණි. | උක්ත සඳහන් ව්‍යාපෘතිය සඳහා ලබාගත් මුදල් නියමිත කාලයේ උපයෝජනය කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | මුදල් රෙගුලාසි 570 ප්‍රකාරව, ඉඩම් අත්පත් කිරීම සඳහා තැන්පත් කළ මුදල් තැන්පත් කළ දිනයේ සිට වර්ෂ 10ක් තැන්පත් ගිණුමේ රඳවා තැබිය හැකි බැවින් අදාල ව්‍යාපෘතිය අවසන් වන තුරු තැන්පතු ගිණුමේ පවත්වාගෙන යනු ලැබේ. |

**3.** **මෙහෙයුම් සමාලෝචනය සහ කාර්යසාධනය**

**3.1** **කාර්යසාධනය**

**3.1.1** **ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
| --- | --- | --- | --- |
| (i) | ඊරාවූර්පත්තු ප්‍රදේශයේ විවිධ අඩුපාඩු සහිතව පවතින ළමා උද්‍යාන නවීකරණය කිරීමේ අරමුණින් ජාතික ඒකාබද්ධතා, සහජීවනය සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් 2018 වර්ෂයේ සලසා තිබූ රු.6,700,000ක ප්‍රතිපාදන අදාල අරමුණු සඳහා උපයෝජනය නොකර හා යෝජිත සැලැස්මට පටහැනිව ඉඩම් නැවත ගොඩකිරීම් සංවර්ධන ආයතනයේ අනුමැතිය රහිතව ජලය රැඳි පවතින කුමාරවේලියාර් ගම්මානයේ නව ළමා උද්‍යානයක් ඉදිකිරීම සඳහා වැය කර තිබුණි. | ඊරාවූර්පත්තු ප්‍රදේශයේ ළමා උද්‍යාන නවීකරණය කිරීමේ අරමුණින් ලබාදුන් ප්‍රතිපාදන එම අරමුණු සඳහා පමණක් උපයෝජනය කළ යුතුවේ. | ඊරාවූර්පත්තු ප්‍රදේශයේ ළමා උද්‍යානය සම්බන්ධයෙන් වූ විගණන විමසුම පිළිබඳ තොරතුරු රැස්කරනු ලැබේ. කඩිනමින් මෙම විගණන විමසුම සඳහා පිළිතුරු යවනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| (ii) | මන්මුනේ නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයට අයත් ජනතාවගේ ආර්ථික සහ සමාජ යටිතල පහසුකම් නවීකරණය කිරීමේ අරමුණින් සලසා දුන් ප්‍රතිපාදනවලින් රු.500,000ක් අරමුණට පටහැනිව කාර්යාල ලීබඩු මිලදී ගැනීම සඳහා වැය කර තිබුණි. | අදාල අරමුණු සඳහා ලබාදුන් ප්‍රතිපාදන එම අරමුණු සඳහා පමණක් උපයෝජනය කළ යුතුවේ. | අදාල අරමුණු සඳහා ලබාදුන් ප්‍රතිපාදනවලින් ඉතිරිවූ ප්‍රමාණයෙන් නව ගොඩනැගිලි සංකීර්ණයේ භාවිතය සඳහා ලීබඩු මිලදී ගන්නා ලදි. |

**3.1.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම**

---------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| | --------------------- | -------------- | ------------------------ |
| (i) | ජාතික ඒකාබද්ධතා, සහජීවනය සහ රාජ්‍ය භාෂා අමාත්‍යාංශය විසින් වාකරෙයි ප්‍රදේශයේ විෂනොමැති කෘෂි නිෂ්පාදන වැඩි කර ඒ අනුසාරයෙන් ජනතාවගේ ජීවන මට්ටම සහ පෝෂණ මට්ටම වැඩිකිරීමේ අරමුණින් ඉදිකළ කෘෂි ළිං 54කින් රු.2,072,950ක ළිං 15ක් වර්ෂයකට අධික කාලයක සිට වගාකටයුතු සඳහා යොදා නොගෙන පාළුවට ගොස් අතහැර දැමූ තත්ත්වයක පැවතුණි. | අදාල කෘෂි ළිං ඉදිකිරිමේ අරමුණුවල ඉලක්කය වෙත ලඟාවිය හැකි ආකාරයට ඒවා ක්‍රියාත්මක කළ යුතුවේ. | වර්තමානයේ ළිං 15කින් ළිං 10ක් මුළුමනින්ම හා අනෙකුත් ළිං 5 කොටස් වශයෙනුත් භාවිතා කිරීමටත් කටයුතු කර ඇත. |
| (ii) | තවද, එම අමාත්‍යාංශය විසින් යුද්ධයෙන් ජීවනෝපාය අහිමි වූ ජනතාවගේ ආදායම් මට්ටම ඉහළ නැංවීමේ අරමුණින් එළුවන් සහ කිකිළියන් ඇති කිරීම සඳහා මන්මුනේ නිරිත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2018 වර්ෂයේදි රු.2,969,635ක ප්‍රතිපාන සලසා තිබුණි. නමුත්, මෙම ව්‍යාපෘතියෙන් අපේක්ෂා කළ නිමවුම් මට්ටම ළඟාකරගත හැකි පරිදි විධිමත් ආකාරයට ශක්‍යතා අධ්‍යයනය කර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මකඩ නොකිරීම සිනා මෙම ව්‍යාපෘතිය කෙටි කාලයකින් නිෂ්කාර්යවී පැවතුණි. | ව්‍යාපෘතිවල අදාල ඉලක්කයන් ළඟාකර ගත අයුරින් ඒවා ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. | ඉදිරියේදි මෙවැනි අඩුපාඩු නොවන අයුරින් ක්‍රියාමාර්ග ගෙන ඉලක්කයන් ළඟාකරගත හැකි ආකාරයට පියවර ගැනීමට කටයුතු කරනු ලබන අතර සම්බන්ධිත නිලධාරීන්ට එරෙහිව ක්‍රියා කරන බවද දන්වා සිටිමි. |

### 3.1.3 අපේක්ෂා කළ ප්‍රතිඵල ලබානොගැනීම

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|
| කොරලේපත්තු බටහිර ප්‍රාදේශීය ලේකම් කාර්යාල බලප්‍රදේශයට අයත් කාවත්තමුනෙයිහි පිහිටි අත්හැර දමා තිබුණු ළිඳ මගින් අලුතින් ඉදිකළ නිවාස ව්‍යාපෘතියේ ජනතාවට පානීය ජලය බෙදාහැරීමේ වැඩසටහන සඳහා ග්‍රාමීය යටිතල පහසුකම් විශේෂ වැඩසටහන මගින් හා ජාතික ඒකාබද්ධතා, සහජීවන කාර්යාලයෙනුත් රු.2,954,000ක් වැය කර තිබුණි. එසේ වුවත්, ජාතික ජල සම්පාදන හා මලාපවහන මණ්ඩලය විසින් ලබාදුන් තත්ත්ව සහතිකය අනුව මෙම ළිං ජලයේ අධික වශයෙන් ඇමෝනියා අම්ල පවතින බැවින් මෙම ජලය භාවිතා කරන ජනතාවට උග්‍ර පාචනය, කහඋණ, මහබඩවැල ආසාදනයන් සහ වකුගඩු රෝග ආදිය වැඩි වශයෙන් ඇතිවිය හැකි අවස්ථා පවතින බැවින් මෙම ව්‍යාපෘතිය මගින් අපේක්ෂා කළ ප්‍රතිඵල ලබාගත නොහැකි වී තිබුණි. | මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට ප්‍රථම විධිමත් ශක්‍යතා අධ්‍යයනයන් සහ ළිං ජලයේ තත්ත්ව සහතිකය ලබා ගැනීමෙන් පසුව එය ක්‍රියාතමක කළ යුතු අතර පදිංචි කළ ජනතාවට සුදුසු ආකාරයෙන් ජනතා සුභසාධනය සැලසිය හැකි පරිදි ලබාදීමට කටයුතු කළ යුතුවේ. | ජනතාවට බලපාන අන්දමේ වැඩසටහන් සුදුසු තාක්ෂණික විශේෂඥයින්ගේ උපදෙස් ලබා ක්‍රියාකරන ලෙසට ප්‍රාදේශීය ලේකම්වරයාට උපදෙස් ලබාදී තිබුණි. ඉදිරි අනාගතයේදි මෙවැනි අඩුපාඩු සිදුනොවන අයුරින් සැලැසුම් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

### 3.1.4 මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඔට්ටමාවඩි ප්‍රදේශයේ කුඩා ඇඟළුම් කර්මාන්ත ශාලා දෙකක් ස්ථාපිත කිරීම සඳහා 2016 වර්ෂයේ ග්‍රාමීය ආර්ථික කටයුතු අමාත්‍යාංශයෙන් සහ 2017 වර්ෂයේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයෙන් රු.4,912,500ක් වැය කර තිබුණි. නමුත් ඉදිකළ මෙම ඇඟළුම් කර්මාන්ත ශාලා දෙකම වර්ෂ 2කට අධික කාලයක් අදාල අරමුණු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | මෙම කර්මාන්ත ශාලා දෙකම ආරම්භ කිරීමට කටයුතු කළ යුතුවේ. | ඔට්ටමාවඩි ප්‍රදේශයේ ඇඟළුම් කර්මාන්ත ශාලා දෙකක් ස්ථාපිත කිරිම පිළිබඳ විගණන විමසුමට අදාල තොරතුරු රැස් කෙරේ. කඩිනමින් මෙම විගණන විමුමට පිළිතුරු ඔබ වෙත යවනු ලැබේ. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

---------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම් |
|---|---|---|---|
| (i) | කාර්යාලයේ භෞතික සම්පත් ආරක්ෂා කිරීම, කාර්යාල කටයුතු දෛනිකව අධීක්ෂණය කිරීම, ආධාර එකතු කිරීම සහ වීඩියෝ දත්ත ගබඩා කිරීම සඳහා කාත්තාන්කුඩි ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.280,058ක වියදමින් ස්ථාපිත කළ ආරක්ෂක කැමරා වර්ෂ 03කට අධික කාලයක සිට භාවිතා කිරීමට කටයුතු කර නොතිබුණි. | කාර්යාලයේ භෞතික සම්පත් ආරක්ෂා කිරීම, කාර්යාල කටයුතු දෛනිකව අධීක්ෂණය කිරීම, ආධාර එකතු කිරීම සහ වීඩියෝ දත්ත ගබඩා කිරීම සඳහා ස්ථාපිත කළ ආරක්ෂක කැමරා භාවිතා කිරීමට කටයුතු කළ යුතුවේ. | කාර්යාලයේ ආරක්ෂිත කැමරාවලින් වීඩියෝ පටිගත කිරීම්, නිලධාරීන්ගේ පැමිණීම සහ පිටවීම තහවුරු කිරීමේ ලේඛනයක් ලෙස මේ දක්වා භාවිතා කර නොතිබුණි. |
| (ii) | කෝරලේපත්තු උතුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2018 වර්ෂයේදි ගංවතුරෙන් පීඩාවට පත් අයට පිසූ ආහාර ලබාදීම සම්බන්ධයෙන් රු.101,600ක් අයුතු ලෙස පරිහරණය කිරීම පිළිබඳව සම්බන්ධිත නිලධාරීන්ට එරෙහිව කිසිදු විනය පරීක්ෂණ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අයුතු ලෙස පරිහරණය කිරීමට සම්බන්ධිත නිලධාරීන්ට එරෙහිව නියමිත කාලය තුළ විනය පරීක්ෂණ ක්‍රියාමාර්ග ගත යුතුවේ. | ඉහත ක්‍රියාවට සම්බන්ධිත නිලධාරීන් විමර්ෂණය කිරීමෙන් පසුව චෝදනා පත්‍ර සකස්කර ක්‍රියාකිරීමට සුදුසු නිලධාරීන්ට යවා ඇත. |

**4.** **මානව සම්පත් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | පුරප්පාඩු පවතින ග්‍රාම සේවක නිලධාරි තනතුරු 81ක් සඳහා ස්ථිර නිලධාරීන් බඳවා නොගැනීම නිසා ග්‍රාම සේවක වසම්වල පරිපාලන කටයුතු දුර්වල තත්ත්වයක පවතී. | පුරප්පාඩු පවතින ග්‍රාම සේවක නිලධාරි තනතුරු 81ක් සඳහා ස්ථිර නිලධාරීන් බඳවා ගැනීමට කටයුතු කළ යුතුය. | ස්වදේශ කටයුතු, පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශයට පුරප්පාඩු පිළිබඳ විස්තර සතිපතා සිකුරාදා දිනයන්හි විද්‍යුත් තැපැල මගින් යවනු ලැබේ. |
| (ii) | කෝරලෙයිපත්තු මධ්‍යම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පුරප්පාඩුව පවතින සහකාර සැලැසුම් අධ්‍යක්ෂ තනතුර සඳහා, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරික්තව පවතින සහකාර සැලැසුම් අධ්‍යක්ෂවරයා ස්ථාන මාරු කිරීමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාමාර්ග නොගැනීම නිසා එම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සැලැසුම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි. | දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අතිරික්තව පවතින සහකාර සැලැසුම් අධ්‍යක්ෂවරයා පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ස්ථාන මාරු කිරීමට කටයුතු කළ යුතුවේ. | අතිරික්තව පවතින සහකාර සැලැසුම් අධ්‍යක්ෂවරයා පුරප්පාඩුව පවතින ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට ස්ථාන මාරු කිරීමට කටයුතු කරනු ලැබේ. |